මත් බව ඇති කරන සියලු දෑ මත් ද්රව්ය වේ. මත් බව ඇති කරන සියලු දෑ තහනම් වේ. කවරෙකු මෙලොවෙහි මත් පැන් පානය කොට ඔහු එයට ඇබ්බැහි වී, පාපක්ෂමාවෙහි නිරත

නොවූ තත්ත්වයේ මිය ගියේ ද ඔහු මතුලොවෙහි එය පානය නො කරන්නේමය

අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) ප්රකාශ කළ බව ඉබ්නු උමර් (රළියල්ලාහු අන්හුමා) විසින් වාර්තා කරන ලදී. මත් බව ඇති කරන සියලු දෑ මත් ද්රව්ය
වේ. මත් බව ඇති කරන සියලු දෑ තහනම් වේ. කවරෙකු මෙලොවෙහි මත් පැන් පානය කොට ඔහු එයට ඇබ්බැහි වී, පාපක්ෂමාවෙහි නිරත නොවූ තත්ත්වයේ මිය ගියේ ද ඔහු මතුලොවෙහි එය පානය නො කරන්නේමය."
[صحيح] [رواه مسلم وأخرج البخاري الجملة الأخيرة منه]

මනස විකෘති කරන, බුද්ධිය පහ කරන සෑම දෙයක්ම, එය පානයක් හෝ ආහාරයක් හෝ වේවා, ආශ්වාස කරන යමක් හෝ වේවා, ඒ හැර වෙනත් කිසියම් දෙයක් හෝ වේවා ඒවා සියල්ල මත් බව ඇති කරන මත් ද්රව්ය වේ. සැබැවින්ම මනස විකෘති කරන බුද්ධිය පහ කරන සෑම දෙයක්ම එය අධික වුව ද අල්ප වුව ද සර්වබලධාරී අල්ලාහ් ඒ්වා තහනම් කර ඇති අතර ඉන් වැළැක්වීය. මෙම මත් වර්ග අතරින් කවර වර්ගයක් කවරෙකු හෝ පානය කර එහි ඔහු ඇබ්බැහි වී පසුව මිය යන තෙක්ම ඒ ගැන පශ්චාත්තාප වී සමාව අයැද නොසිටියේ නම් ඔහුට ස්වර්ගයේ එය පානය කිරීම තහනම් කරමින් අල්ලාහ්ගේ දඬුවමට ඔහු සුදුස්සෙකු වනු ඇත.

https://sunnah.global/hadeeth/si/show/58259